සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

11 ශ්‍රේණිය **ක්‍රිස්තියානි ධර්මය - I** කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. ''ගමේ දිවැසිවරයා ගමට අගේ නැත'' මෙම ප්‍රකාශය කරනු ලැබුවේ,
(1) ගලීල මුහුද අසලදීය. (2) නාසරෙත් සිනගෝගයේදීය.
(3) කන්ද උඩ දේශනයේදීය. (4) සීමොන්ගේ නිවසේදීය.

02. ජේසුස් වහන්සේ මරණයට මුහුණදීමට පෙර යාච්ඤා කිරීම තුළින් ලැබුවේ,
(1) ඉවසීම හා ශක්තියය. (2) දුක්විඳීම හා ඉවසීමය.
(3) කැපවීම හා බලාපොරොත්තුවය. (4) ශක්තිය හා කැපවීමය.

03. ස්නාවක ජොහාන්තුමාගේ යටහත් පහත් බව අවධාරණය කරන ප්‍රකාශය,
(1) ''අඳනා දෙකක් ඇති අය නැති අයට දෙන්න'' යන්නය.
(2) ''නියමිත පමණට වඩා අයබදු නොගන්න'' යන්නය.
(3) ''බලහත්කාරයෙන් කිසිවක් පැහැර නොගන්න'' යන්නය.
(4) ''එතුමාණන්ගේ පාවහන් පටි මුදන්නටවත් මම නොවටිමි'' යන්නය.

04. ''ස්වාමීනී මා ඔබගේ උපකරණයක් කරගත මැනව'' මෙලෙස ප්‍රකාශ කරනු ලැබුවේ,
(1) අසීසයේ ෆ්‍රැන්සිස්තුමා ය. (2) ස්තේපන් තුමාය.
(3) යේසුස් වහන්සේ ය. (4) ජුවාම් පාවුළු පාප් වහන්සේය.

05. තම අන්තවාදී ආගමික හා දේශපාලනික අදහස් ජනතාවට පිළිගැන්වීමට උත්සුක වූ පිරිසක් වන්නේ,
(1) විනයධරයන් ය. (2) පරිසිවරු ය. (3) සදුසිවරුන් ය. (4) පූජකවරුන් ය.

06. මනුෂ්‍ය පුත්‍රයා සබත් දිනට පවා අධිපතිඳාණෝ යයි යේසුස් වහන්සේ පැවසූ වදනෙහි සත්‍යතාව පසක් කිරීමට අදාල නිදසුන වන්නේ,
(1) උපවාසය හා සබත පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කිරීම තුළින් ය.
(2) කුදු ස්ත්‍රියට හා මහලේ රෝගී කාන්තාවට සුවය ලබාදීම තුළින් ය.
(3) ලාදුරු රෝගියාට හා දිය උදර රෝගියාට සුවය ලබාදීම තුළින් ය.
(4) දිය උදර රෝගියාට හා අතක් පණ නැති මිනිසාට සුවය ලබාදීම තුළින් ය.

07. දෙවියන් වහන්සේගෙන් ලබන වරමක් වන පුනරුජ්ජීවනය ලබන අය සමාන කරන්නේ,
(1) සුරංගනාවන්ට ය. (2) දේව දූතයන්ට ය. (3) ශුද්ධාත්ම අනුහසට ය. (4) දේවානුභාවයට ය.

08. සදුසිවරුන් හා ඔවුන් විසින් පිළිගත් ව්‍යවස්ථාවලියේ කතෘවරයාණෝ ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) ආබ්‍රහම් ය. (2) ඊසාක් ය. (3) මෝසෙස් ය. (4) දෙවියන් වහන්සේ ය.

09. ජුදෙව්වරු වාර්ෂිකව පැවැත් වූ පාස්කුව හැඳින්වූ තවත් නමකි,
(1) නුමුහුන් රොටී මංගල්‍යය ය. (2) පාස්කු බැටළුවා පිළිබඳ මංගල්‍යය ය.
(3) කුළුඳුලන් කැපකිරීමේ මංගල්‍යය ය. (4) ජුදා මංගල්‍යය ය.

10. ජේසුස් වහන්සේ දේවමාලිගාව පවිත්‍ර කිරීමේ තවත් එක් අරමුණක් වන්නේ,
(1) ජේසුස් වහන්සේගේ රාජ තේජස ප්‍රකාශ කිරීමය.
(2) ජනතාවගේ වරද නිවැරදි කිරීමය.
(3) දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨකම නොතකා ක්‍රියාකරන ජුදෙව් ජනතාව අවධි කිරීමය.
(4) තමන්ගේ මෙහෙවර ප්‍රකාශ කිරීමය.

11. ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගෙන ආ ජේසුස් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්න වලින් ඔවුන් බලාපොරොත්තු වූයේ,

(1) ජේසුස් වහන්සේ පීඩනයට පත් කිරීමය.

(2) ජේසුස් වහන්සේ වරදකරු බවට පත් කිරීමය.

(3) ජේසුස් වහන්සේ සිරගත කිරීමය.

(4) ජේසුස් වහන්සේගේ වචන උන්වහන්සේටම විරුද්ධව සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීමය.

12. ''ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝය'' යනුවෙන් පේදුරු තුමා ප්‍රකාශ කිරීමෙන් අරුත් ගැන්වෙන්නේ,

(1) ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ බලාපොරොත්තු ජේසුස් වහන්සේ තුළින් ඉටු වී ඇති බව වටහා ගැනීමය.

(2) යේසුස් වහන්සේගේ සේවකත්වය වටහා ගැනීමය.

(3) ජේසුස් වහන්සේ පිළිබඳ සාක්ෂි දැරූ බවය.

(4) ජේසුස් වහන්සේගේ සේවය ගැන පේදුරුතුමා කලින් දැන සිටි බවය.

13. ජුදෙව් මන්ත්‍රණ සභාවේ සාමාජිකයෙකු වුවද ජේසුස් වහන්සේ සම්බන්ධව ජුදෙව්වන්ගේ ක්‍රියා කලාපය අනුමත නොකළ පුද්ගලයෙක් වන්නේ,

(1) ජුදස් ය. (2) පාවුල් ය.

(3) අරිමාතියෝ ජෝසෙප් ය. (4) සිරේනියේ සීමොන් ය.

14. ''ඒකාන්තයෙන්ම සමිඳාණන් වහන්සේ නැගිට සිටින සේක'' යනුවෙන් ජේසුස් වහන්සේ ජීවමාන වැඩ සිටීම පිළිබඳ සාක්ෂි දැරුවේ,

(1) ස්ත්‍රීන් ය. (2) පේදුරු ය.

(3) තෝමස් ය. (4) එම්මාවුස් ගමටගිය ගෝලයෝ ය.

15. ක්‍රිස්තුස් වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් හා ගින්නෙන් ජනතාව බව්තිස්ම කරන බව ස්නාවක ජොහන්තුමා ප්‍රකාශ කර ඇත. මෙම ගින්න මගින් සංකේතවත් කරන්නේ,

(1) පාපය ය. (2) පාපයද දවා පිරිසිදුවීම හා දේව අභිමුඛත්වය ය.

(3) ශුද්ධාත්ම ගින්න ය. (4) ශුධාත්මානුභාවය ය.

16. ධනය, බලය, කීර්තිය වැනි දේට මුල්තැන දෙන සමාජයක වෙසෙන කිතුණු අපට වැදගත් වන පණිවිඩයක් යේසුස් වහන්සේ ලබාදුන්නේ,

(1) පළමු පරීක්ෂාවේදී ය. (2) දෙවන පරීක්ෂාවේදී ය. (3) තෙවන පරීක්ෂාවේදී ය. (4) පාළුකරයේදී ය.

17. අන්වෙසක් වීම තුළදී ජේසුස් වහන්සේගේ මුහුණ වෙනස්වීම, වස්ත්‍ර ධවල කාන්තියෙන් බැබලීම තුළින් සංකේත කලේ,

(1) ජේසුස් වහන්සේ තුළ පැවති තෙජශ්‍රීයයි. (2) ව්‍යවස්ථාව හා දිවැසාවලිය සම්පූර්ණවීමයි.

(3) ජේසුස් වහන්සේ ඉටු කරන ජීවිත පූජාවයි. (4) ජේසුස් වහන්සේ ඉටු කරන සේවකත්වයයි.

18. A ජේසුස් වහන්සේගේ දැක්ම අප තුළ තිබීම.

B ජේසුස් වහන්සේ අධිකාරිත්වයට හා රාජකීයත්වයට නතුවීම.

C දේව වචනය තුළ දිවිගෙවමින් ආශිර්වාද ලැබීම.

D නොකඩවා යාච්ඤාවෙන් හා ඇදහිල්ලෙන් දේව කැමැත්ත සෙවීම.

ඉහත කරුණු අතරින් දේව රාජ්‍යයේ වර්ධනය අත්දැකීම සඳහා අවශය වන කරුණු ඇතුලත් පිළිතුර වන්නේ,

(1) A හා B ය. (2) C හා D ය. (3) A, B, D ය. (4) A, B, C, D ය.

19. තමාට හිමි අධිකාරිත්වය ගැන දැන සිටියත් එය පසෙක දමා දේව රාජ්‍යයේ රජවන යේසුස් වහන්සේගේ අධිකාරිත්වයට නතු වුයේ,

(1) ජෙරිකෝවේ අන්ධ මිනිසාය. (2) ජයිරස්ගේ දියණිය.

(3) නායින් නුවර වැන්දඹුවගේ පුත්‍රයාය. (4) කපර්ණවුමේ ශතාධිපතියාය.

20. පාපයේ ජීවිතයෙන් ඈත් වී මනස්ථාපනයෙන් නිවැරදි මගකට යොමුවීමට ඉවහල් වන උපමා කතාව වන්නේ,

(1) දැළ පිළිබඳ උපමාවය. (2) නැති වූ කාසය පිළිබඳ කතාවය.

(3) නිධානය පිළිබඳ උපමාවය. (4) අබ ඇටය පිළිබඳ උපමා කතාවය.

21. ඔබේ ඉඟටිය බැඳ ගන්න. පහන් දල්වා ගන්න යන අගනා වදනින් දේව රාජ්‍යයේ පුරවැසියන් වන අපට දෙන පණිවිඩයක් වන්නේ,

(1) බලාපොරොත්තුවෙන් සිටිය යුතු බවයි.

(2) විශ්වාසයෙන් සිටිය යුතු බවයි.

(3) කැපවීමෙන් හා විශ්වාසයෙන් සිටිය යුතු බවයි.

(4) අවදිව, අපේක්ෂා සහිතව සූදානමෙන් හා නොඉවසිල්ලෙන් සිටිය යුතු බවයි.

22. රන් කාසි දසය පිළිබඳ උපමාවේදී රන්කාසියක් ලැබ එයින් රන්කාසි 10 ක් උපදවාගත් තැනැත්තා තුළින්,

(1) තම හැකියා උපරිම අන්දමින් දේව රාජ්‍යයේ සේවයට යෙදවීම වැදගත් බව ප්‍රකාශ කරයි.

(2) හැකියාවන් හැකි ආකාරයට සේවයට යෙදවිය යුතු බව ප්‍රකාශ කරයි.

(3) සඟවා තබාගත යුතු බව ප්‍රකාශ කරයි.

(4) පසුකාලෙක ප්‍රයෝජනයට ගැනීමට ආරක්ෂා කළ යුතු බව ප්‍රකාශ කරයි.

23. ජුදා සමාජය තුළ පැවති යහපත් වටිනාකම් වන්නේ,

(1) විශ්වාසයය. ප්‍රතිඋපකාරය, සවන්දීම ය. (2) විශ්වාසය, කීකරුකම, විනයගරුක බව ය.

(3) සාරධර්ම, ආදහිල්ල, යහපත් බව ය. (4) දසපනත, කීකරුකම, සවන්දීම ය.

24. ඊශ්‍රායෙල් ඉතිහාසයේ පූජකවරයාට, දිවැසිවරයාට හා රාජ්‍යත්වයට ආලේප කළ අය සඳහා උදාහරන ලෙස ගත හැක්කෙ,

(1) ආරෝන්ගේ පුත්‍රායෝ, එලීෂා, නිම්ෂිගේ පුත් ජේහුය.(2) ආරොන්, දාවිත්, සාමුවෙල් ය.

(3) එලීෂා, දාවිත්, සාමුවෙල් ය. (4) සාමුවෙල්, ජේහු, එලියා ය.

25. දුක් විඳිනා සේවක ලක්ෂණයක් නොවන්නේ,

(1) දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය ලබා තිබීමය.

(2) මෘදු ලීලාවෙන් කටයුතු කිරීමය.

(3) යුක්ති සහගත ලෙස ක්‍රියා කිරීමය.

(4) පව්කරුවන්ගේ පව් දරා නොගැනීමය.

26. ප්‍රේමය පිළිබඳව යේසුස් වහන්සේගේ ඉගැන්වීම වන්නේ,

(1) සියල්ලන්ට එකලෙස ප්‍රේම කිරීමය.

(2) තමාට මෙන් තම අසල්වැසියාට ප්‍රේම කිරීමය.

(3) ප්‍රේමයෙන් දන්දෙන්න යන්නය.

(4) තමාට ඇති සියල්ල අන් අය සමඟ ප්‍රේමයෙන් බෙදා ගන්න යන්නය.

27. සාමය ඇති කිරීමට අප ක්‍රියාකල යුත්තේ,

(1) සාමය පැතීමෙන් ය. (2) සැමට එකලෙස සැලකීමෙන් ය.

(3) සාමය බිඳී යන ක්‍රියාවලින් වැලකීම ය. (4) කුලල් කා නොගැනීමෙන් ය.

28. කමාව පිළිබඳව ඉගැන්වීමට පමණක් සීමානොවී තම ජීවිත පූජාවෙන් ද එය පෙන්වා දුන්නේ,

(1) දෙව් පියාණන් වහන්සේ ය. (2) අසීසියේ ප්‍රැන්සිස් තුමා

(3) II වන ජුවාම් පාවුල් පාප වහන්සේ ය. (4) ගරු පීටර් පෙරාඩ් ද සිල්වා දේවගැතිතුමා ය.

29. ''ඔබ මා තුළද මා ඔබ තුළ ද සිටින්නාක් මෙන් ඔවුන් ද අප තුළ සිටන පිණිස මම ඔවුන් උදෙසා යාච්ඥා කරමි.'' යනුවෙන් සඳහන් වන්නේ,

(1) අන්තම රාත්‍රී භෝජනය අවස්ථාවේදී ය. (2) උත්තම පූජක යැදුමේ ය.

(3) ස්වාමින් වහන්සේගේ යාච්ඥාවේ ය. (4) ක්‍රිස්තු උත්ථානයේදී ය.

30. මුල් කිතුණු සභාව ස්ථාපිත වූයේ,

(1) කුඩාරම් මංගල්‍යදී ය. (2) අස්වනු මංගල්‍යයේදී ය.

(3) පෙන්තකොස්ත මංගල්‍යයේදී ය. (4) ක්‍රිස්තු උත්ථානයේදී ය.

31 මුල් කිතුණුවන් නමස්කාරික ජීවිතයේ නියැලුන බවට ගතහැකි අවස්ථාවක් වන්නේ,

(1) දිනපතා නොකඩවා එක්සිත්ව දේවමාලිගාවට රැස්වීම ය.

(2) සුභ අස්න දේශනා කිරීමය.

(3) සියල්ල පොදුවේ තබා ගැනීමය.

(4) සාකච්ඡාවෙන් විසඳුම් සෙවීමය.

32. විජාතීන්ගේ අපෝස්තලුවරයා ලෙස හඳුන්වන්නේ,

(1) පාවුල් ය. (2) පේදුරු ය. (3) ජොහන් ය. (4) අන්ද්‍රෘ ය.

33. පාවුල් පරිසිවරයෙකු ලෙස තම සේවාව අකුරටම ඉටු කළ බව ප්‍රකාශ කිරීමට යෝග්‍ය නොවන ප්‍රකාශය වන්නේ,

(1) ජුදා ආගමේ පදනම වූ පංච පුස්තකය මනාව හැදෑරීම ය.

(2) කෙන්ක්‍රෙයාවේ දී හිස මුඩු කිරීම හා තිමෝතියස් චර්මච්ඡේදනය කිරීමය.

(3) ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයේ සාමාජිකයෙකු වීමය.

(4) සිය පියාගේ අභාසයෙන් රෝම පුරවැසි භාවය ලැබීමය.

34. නීතිය අයථාලෙස භාවිතා කළ නිලධාරීන්ට විරෝධය පල කරමින් අභියෝග ජයගැනීමට හැකිවූ සිද්ධිය වන්නේ,

(1) ගුප්ත දෑ හෙළි කරන ආත්මයක් ආවේශව සිටි වහල් තරුණියට සුවය දීම සම්බන්ධ සිද්ධිය ය.

(2) ලිදියාගේ සිත් හැරීම හා සම්බන්ධ සිද්ධිය ය.

(3) ඇතන්ස්හි නාඳුනන දෙවියන්ට වෙන් කළ පූජාසනය පිළිබඳ සිද්ධිය ය.

(4) කොරෙන්ති නගරයේ දූරාචාරයට එරෙහිව කටයුතු කළ සිද්ධිය ය.

35. ස්නාවක ජොහාන්ගේ බව්තිස්මය ගැන පමණක් දැන සිටි නමුත් අකිලා ප්‍රිස්කිලා විසින් දෙවියන් වහන්සේගේ මාර්ගය හරි ලෙස පහදා දුන්නේ,

(1) ත්‍රෝවසයේ යුකිකස්ටය. (2) ව්‍යක්ත කථිකයෙක් වූ අපොල්ලස්ටය.

(3) අගබස් දිවැසිවරයාටය. (4) ස්තෝයික දාර්ශනිකයින්ටය.

36. මිත්‍යා මත, රූපවන්දනාවෙන් මිනිසුන් වලක්වා එකම සැබෑ දෙවිඳුන් නමස්කාර කිරීමට ඔවුන් යොමු කිරීමේ අභියෝගයට පාවුල් තුමා මුහුණ දෙන්නේ,

(1) කොරෙන්තියේදී ය. (2) දමස්කයේදී ය. (3) එපීසයේදී ය. (4) ඇතන්ස්වලදී ය.

37. පාවුල්තුමාගේ තෙවන ධර්මදූත ගමන තුළින් අපට ලබාගත හැකි ආදර්ශය වන්නේ,

(1) අධෛර්‍යයට පත්නොවීම ය.

(2) නොසැලී දිරිමත්වීම ය.

(3) ශුද්ධාත්ම සවිය තුළ බාධා හා අභියෝග ජයගත හැකි බවය.

(4) නොපසුබට වීර්යයෙන් කටයුතු කළ යුතු බවය.

38. පාවුල්තුමා ජෙරුසපලමේදී දඬුවම් නොලැබ රෝම අධිරාජ්‍යයාගේ විනිශ්චය ඉල්ලා සිටීමෙන් පැහැදිලි වන්නේ,

(1) පාවුල්තුමා තම අවසන් මොහොත වන තෙක්ම ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමය.

(2) තම සේවය සම්පූර්ණත්වයට පත් කිරීමය.

(3) රෝම පුරවැසි භාවය ලැබීමේ වාසි සහගත බවය.

(4) රෝම ගමනට කැමැත්තක් දැවීමය.

39. ක්‍රිස්තුස් වහන්සේට අයිතිවීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(1) අපගේ ජීවිත ආකල්ප වෙනස් කර ජීවමාන ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයෙන් ආලෝක වී නව ජීවිතයකට පරිවර්ථනය වීමය.

(2) ජේසුස් වහන්සේට යටත් වී දිවි ගෙවීමය.

(3) වැරදිවලින් ඈත් වී නිවැරදිවීමය.

(4) නැවත පව් නොකර යහපත්ව ජීවත් වීමය.

40. ක්‍රිස්තුස් වහන්සේ සමග පෞද්ගලික බද්ධවන අපගේ ජීවිත,

(1) ඉතා උතුම් බවට පත්වේ.

(2) ඉතා බලවත් වේ.

(3) අඳුර පලවා හරින ආලෝකය දෙන තාරකා මෙන් බැබලේ.

(4) පිවිතුරු වේ.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **ක්‍රිස්තියානි ධර්මය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) පහත සඳහන් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

i. ජුදෙව් පෙන්තකොන්ත මංගල්‍යයේ ඇති විශේෂත්වය කුමක්ද?

ii. ලොව පුරා ඇතිවන සාගතයක් ගැන අනාවැකි කී දිවැසිවරයා කවුද? එම සාගතය ඇති වුයේ කුමන රජතුමාගේ කාලයේදී ද?

iii. පාවුල් තුමාගේ දෙවන ධර්මදූත ගමනේ පිලිප්පියේදී සිදු වූ විශේෂ සිදුවීම් 2 ක් සඳහන් කරන්න.

iv. ජේසුස් වහන්සේ ''මට වතුර ටිකක් දෙන්න'' සමාරි ස්ත්‍රියගෙන් ඉල්ලු විට ඇය ලබාදුන් පිළිතුර කුමක්ද?

v. අපෝතළුවරු විසින් සුව කරනු ලැබු ප්‍රථම සුව කිරීම කුමක්ද? එය සිදුකරනු ලැබුවේ කොහේදී ද?

vi. ''ගොයම නම් බහුලය, ගොවීහු විරලය'' මෙහි අදහස ලියන්න.

vii. ජේසුස් වහන්සේ සේවක නායකත්වය ආදර්ශයෙන් පෙන් වු අවස්ථා 2 ක් නම් කරන්න.

viii. ''ස්වාමිනී, ඔබ හා සමඟ හිරේ යාමට හා මරණයට වුවද මම සුදානම්'' මෙලෙස පැවසුවේ කවුද? කාහටද?

ix. ජෙරුසලම් මන්ත්‍රණ සභාවේදි ගත් තීරණ 2ක් සඳහන් කරන්න.

x. සභා එකමුතුව සඳහා උත්සහ දරණ ආයතන (සංවිධාන) 2 ක් ලියන්න.

(2  10 = 20)

(02) i. දේව සැලැස්මට අවනත වූ නව ගිවිසුමේ පුද්ගලයින් 2 ක් නම් කරන්න.

ii. ඔවුන්ගෙන් එක් අයෙකු දේව හඬට දැක් වූ ප්‍රතිචාරයක් ලියන්න.

iii. ''දේව සැලැස්ම තුළ ක්‍රියාකාරී වීමට අපවද කැඳවන සේක'' ඒ සඳහා නිසි ප්‍රතිචාර දැක්වීමට ඔබ සුදානම් වන ආකාර 5 ක් කෙටියෙන් විස්තර කරන්න.

(2  3  5 = 10)

(03) i. ජේසුස් වහන්සේ ප්‍රථමයෙන්ම තෝරාගත් ශ්‍රාවකයන් නම් කරන්න.

ii. පේදුරු ජේසුස් වහන්සේ හඳුනා ගැනීමෙන් පසු ක්‍රියාකල ආකාරය තුළින් ඔබට ලබාගත හැකි ආදර්ශ 3 ක් ලියන්න.

iii. ''යලිත් ඔබ හැරුණු පසු ඔබේ සහෝදරයන් ධෛර්මත් කරන්න'' ජේසුස් වහන්නේ පේදුරුට පැවසු මෙම ප්‍රකාශය තුළින් ඔබ සමාජය තුළ ක්‍රියාකරන ආකාරය පැහැදිලි කරන්න.

(2  3  5 = 10)

(04) i. දේව රාජ්‍යයේ පුරවැසියන් තම අවශ්‍යතා වල ඇලී ගැලී කරදර වීම අනවශ්‍යය බව පෙන්වීමට ජේසුතුමා දක් වූ උදාහරණ 2 ක් නම් කරන්න.

ii. දේව රාජ්‍යයේ පුරවැසිභාවය ලැබීමට බාධා කරන අභියෝග 3 ක් නම් කරන්න.

iii. අවශ්‍යතා සංකීර්ණ වී තිබෙන වත්මන් යුගයේ ධනපතියා හා ලාසරුස්ගේ උපමා කතාව මඟින් ඔබේ කිතුනු ජීවිතය හැඩගන්වා ගන්නා අයුරු පැහැදිලි කරන්න.

(2 3 5 = 10)

(05) i. රාත්‍රී කාලයේ ජේසුස් වහන්සේ හමුවීමට පැමිණි පුද්ගලයා කවුද? ඔහු කුමන කාර්යක යෙදී සිටි පුද්ගලයෙක්ද?

ii. ඔහු ඇසු ප්‍රශ්න වලට ජේසුස් වහන්සේ ප්‍රතිචාර දක්වමින් පැවසු ප්‍රකාශය කුමක්ද?

iii. එම ප්‍රකාශය අනනුව ජීවිත පරිවර්තනයකට යොමු වූ ඔබ සමාජය තුළ ක්‍රියාකරන ආකාරය කරුණු 5 න් විස්තර කරන්න.

(2 3 5 = 10)

(06) i. පළමු ධර්ම දූත ගමනට පාවුල්තුමා හා සහභාගී වූ අය නම් කරන්න.

ii. ලුස්ත්‍රාවේ කොර වූ මිනිසා සුවපත් කිරීමෙන් පසු මිනිසුන් ක්‍රියා කල අයුරු කෙටියෙන් සඳහන් කරන්න.

iii. ''මනුෂ්‍යයන් ඔබ මේ දේවල් කරන්නේ මන්ද? අපිත් ඔබ හා සමාන මිනිස්සුය.'' පාවුල් තුමා මෙලෙස පැවසීමෙන් වත්මන් සේවයේ යෙදෙන අපහට ගෙන එන පණිවිඩ 5 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(2 3 5 = 10)

(07) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. ජෙරුසලම් මන්ත්‍රණ සභාව

ii. කිතුණු බලාපොරොත්තුව

iii. පෙරමඟ දූත සේවය

iv. කමාව දීම හා ලැබීම

(5 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(1) | 3 -(4) | 4 -(1) | 5 -(2) | 6 -(4) | 7 -(2) | 8 -(3) | 9 -(1) | 10 -(3) |
| 11 -(4) | 12 -(1) | 13 -(3) | 14 -(4) | 15 -(2) | 16 -(2) | 17 -(1) | 18 -(4) | 19 -(4) | 20 -(2) |
| 21 -(4) | 22 -(1) | 23 -(2) | 24 -(1) | 25 -(4) | 26 -(2) | 27 -(3) | 28 -(3) | 29 -(2) | 30 -(3) |
| 31 -(1) | 32 -(1) | 33 -(4) | 34 -(1) | 35 -(2) | 36 -(3) | 37 -(3) | 38 -(1) | 39 -(1) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. ජුදෙව්වරුන් සිය අස්වැන්නේ ප්‍රථම ඵල පිදීමට ජෙරුසලමට පැමිණීමයි.
ii. අගබස් දිවැසිවරයා, ක්ලෞදියස් රජුගේ කාලයේ
iii. • ලිදියා හා නිවසේ සියලු දෙනා හැරීම ලැබීම • වහල් තරුණිය සුව කිරීම
• පාවුල් හා සීලස් සිරගත වීම.
iv. ජුදෙව්වකු වන ඔබ සමාරය ස්ත්‍රියක වන මගෙන් බොන්නට වතුර ඉල්ලන්නේ මන්ද?
v. • උපන්දා සිට කොර වූ මිනිසෙකු • ජෙරුසලමේ සුදර්ශන දොරටුව අසලදී
vi. දේව රාජ්‍යයේ වර්ධනයට සේවකයන් අවශ්‍යය බව
vii. • කුඩා දරුවන් අගය කිරීම • ශ්‍රාවකයන්ගේ පාද සේදීම වැනි පිළිතුරු 2 ක්
viii. පේදුරු විසින් ජේසුස් වහන්සේට
ix. • රූප සම්බන්ධ දූෂ්‍යකම් වලින් වැළකීම • කාමමිථ්‍යාචාරයෙන් වැළකීම
• බොටුව මිරිකා මැරූ සතුන්ගේ මස් කෑමෙන් වැළකීම
x. • ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය • ලංකා බයිබල් සමාගම
• තරුණ ක්‍රිස්තියානි සංගමය ආදී පිළිතුරු 2 ක්

(02) i. එළිසබෙත්, මරියතුමී, ජෝසප්තුමා, සෙකරියස්තුමා
ii. මරියතුමී - ''මම ස්වාමින්ගේ දූතිය වෙමි. ඔබ පැවසූ ලෙස මට ඉටු වේවා''
ජෝසෙප් - මරියතුමී විවාහ කර ගැනීමට කැමති වී සුරැකි පියා වීමට නිහඬව එකඟ වීම.
ආදී කෙනෙකුගේ එක් ප්‍රතිචාරයක්
iii. • සැමවිට දේව වචනයට අනුව ජීවිතය හැඩගන්වා ගැනීම.
• යාච්ඤාවෙන් යුතුව තීරණ ගැනීම වැනි අදාල පිළිතුරු 5 ක් තිබීම.

(03) i. පේදුරු, ඇන්ඩෘ, ජාකොබ් හා ජොහන්
ii. • ජේසුන් වහන්සේගේ හඬට කීකරු වීම.
• තම පාපී ස්වභාවය තේරුම් ගෙන සමාව ලබා ගැනීම.
• ජේසු සමඟ යෑමට බාධා වන සෑම දේ කැප කිරීම. ආදී පිළිතුරු 3 ක් තිබිය යුතුය.
iii. ජීවිතය වෙනස් වීම තුළ අන් අය යහමඟට, ජේසු වෙත දිනා ගැනීමට කරන දේවල් කෙටියෙන් පැහැදිලි කර තිබීම.

(04) i. කපුටන්, මානෙල් මල්
ii. • කැඳවීමේ අභියෝගය • කැඳවීමට ප්‍රතිචාර දක්වීමේ අභියෝගය
• නිහතමානී වීමේ අභියෝගය - ආදී අභියෝග 3 ක් තිබිය යුතුය. (10 ශ්‍රේණිය 108 පිටුව)
iii. 10 ශ්‍රේණිය 114, 115 පිටු වල ඇති කරුණු වලට අදාලව කරුණු 5ක් පමණ ලියා තිබීම.

(05) i. • නිකදේමුන් • ගුරුවරයෙක් • ජුදෙව් ප්‍රධානියෙක්
ii. ''යමෙන් නැවත නූපන්නොත් ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැනගත නොහැකිය.''
iii. ජේසුතුමා හඳුනා ගැනීමට පෙර තිබූ පාප ඉවත් කර, නව ජීවිතයේ තිබෙන යහපත් දේවල් 5ක් කෙටියෙන් විස්තර කර තිබීම.

(06) i. බර්ණබස් හා ජොහන් මාක්
ii. • ''දෙවිවරු මිනිස් වෙසින් බැස සිටිතියි'' ප්‍රකාශ කිරීම.
• ගොන්නු ද මල්මාලා ද සහිතව පුද පූජා පැවැත් වීම.
• පාවුල් හා බාර්ණබස් දෙවිවරුන්ගේ නම් වලින් හැඳින්වීම ආදී දේ කෙටියෙන් ලියා තිබීම.
iii. 11 ශ්‍රේණියේ 54 පිටුවට අනුව කරුණු 5 ක් තිබීම ප්‍රමාණවත්.

(07) කරුණු 5ක් වත් අවම ලෙස එක් මාතෘකාවක් සඳහා විස්තර කර තිබිය යුතුය.